# ධීවර සේවකයින් සදහා වූ ජාත්‍යන්තර සාමූහිකය
# ජාත්‍යන්තර සාගර ආයතනය - ඉන්දියාව

## වෙරළ ආශ්‍රිත ධීවර ප්‍රජාව සහ ඉන්දියානු සාගරයේ අනාගතය වෙනුවෙන් එක්වෙමු
## මදුරාසිය, චෙන්නායි

## 2001 ඔක්තෝබර් 9 - 13

## දර්ශන - ප්‍රකාශණය

1 ඉන්දියානු සාගර කලාපයේ රටවල් 13 ක සහභාගිකයින් - මොසැම්බික්, දකුණු අප්‍රිකාව, කෙන්යා, ටැන්සානියා, මැඩගස්කර්, ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, තායිලන්තය, ඉන්දුනීසියාව, මාලදිවයින සහ සීෂෙල් සමඟ ප්‍රංශයෙන්, බෙල්ජියමෙන්, එක්සත් රාජධානියෙන්, නෝර්වෙන් පැමිණි නියෝජිතයින් වූ අප ඉන්දියාවේ චෙන්නායිහිදී 2001 ඔක්තෝබර් මස 9 සිට 13 දිනවලදී මුණගැසුනෙමු. ධීවර සංවිධාන, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, රාජ්‍ය නොවන ආයතන, රාජ්‍ය ආයතන වලින් පැමිණි අපගේ අරමුණ වූයේ ඉන්දියන් සාගර කලාපයේ වෙරළාශ්‍රිත ධීවර ප්‍රජාවට තිරසාරව සහ සාධාරණත්වයක් ඇතිව ධීවර සම්පත් උපයෝගී කර ගැනීමට අවශ්‍ය එකමුතුකම ගොඩනැගීම පිලිබදව සොයා බැලීම විය.

2 ඉන්දියානු සාගර කලාපය තුල ඉතා ඉහළ ජෛව විවිධත්වයක් සහ විශාල ප්‍රමාණයේ වානිජ මත්ස්‍ය සම්පත් විශේෂද තිබෙන බව නොරහසකි. මෙම මත්ස්‍ය සම්පත ජනතාවට ආහාරය සැපයීමට මෙන්ම රැකියා, ආදායම් සහ විදේශ විනිමයද උපයන මාර්ගයකි. මෙම කලාපය ගත්කල ලෝකයේ වැඩිම ධීවර ජනතාවක් සිටින ප්‍රදේශයක් වශයෙන්ද හැදින්විය හැකිය. මෙයින් වැඩි සංඛ්‍යාවක් විවිධ වර්ගවලින් යුත් ධීවර ආම්පන්න හා යාත්‍රා භාවිතා කරන සුළු පරිමාණ ධීවරයින්වේ. මුහුදුබඩ ධීවර ප්‍රජාවගෙන් විශාල ප්‍රමාණයක් දිළිඳුකමින් ජීවත්වන අතර, ඔවුන් ඉතාමත්ම පීඩිතභාවයට පත්වූ ජනකොට්ඨාශයක් වේ.

3 ගෝලීයකරණයේ හා නිදහස් වෙළදාමේ ප්‍රතිපලය ලෙස සමානාත්මතාවය හා සාධාරණය වෙත් ප්‍රමාණවත් අවධානයක් ඇති නොකරමින් සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ලබා ඇත. මේ තුල වූ ක්‍රියාදාමයන් අතර සීඝ්‍ර නාගරික සංවර්ධනය, දූෂණ කාරක කර්මාන්ත ඒකක වර්ධනය වීම, සුඛෝපභෝගී සංචාරක ව්‍යාපාරය වර්ධනයවීම සහ ජලජීවී ඉස්සන් කර්මාන්තය ව්‍යාප්ත වීම කැපීපෙනේ. මෙම තත්වය, වෙරළ ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශවීම ධීවර ජන ජීවිතය අවතැන්ගතවීම පාරම්පරික ජීවන ක්‍රමවලින් ධීවරයින් ඉවත්වීම වැනි ක්‍රියා කඩිනම් කරඇත.

මෙම තත්වය විධිමත් කිරීමට අත්‍යාවශ්‍යයෙන්ම කල යුතු දේ වනුයේ,

- ✶ වෙරළාශ්‍රිත ප්‍රදේශයේ ගොඩබිම සහ මුහුදු යන සංඝටක දෙකක් අතර වූ ගතික කලාපීය පද්ධතියත් සදහා වූ ප්‍රවේශයද, එම සම්පත් භාවිතයද, ඒකාබද්ධ සම්පත් භාවිත ක්‍රමයක් තුලින් සිදු කිරීම සදහා ඵලදායී නීතිරීති සකස් කිරීම හා ආයතනික ව්‍යුහයන් ස්තාපිත කිරීම සහතික කිරීම.

- ✶ වෙරළාශ්‍රිත සම්පත් භාවිතය ගැන තීරණ ගැනීමේදී සම්ප්‍රදායික වෙරළාශ්‍රිත ප්‍රජාවත්, විශේෂයෙන්ම සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ නියැලී සිටින ප්‍රජාවත් නියෝජනය සහතික කිරීම සදහා සහයෝගිතා මූලධර්මය මත පදනම්වූ සහභාගීත්ව යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

- ✶ වෙරළාසශ්‍රිත ධීවර ජනතාව පාරම්පරිකව සිය ජීවිකාව සදහා භුක්ති විදීමට පුරුදුවී ඇති වෙරළාසන්න ජලජ සම්පත්, ඔවුන්ගේ ප්‍රමුඛ අයිතිවාසිකමක් බවට සහතික කිරීම.

- ✶ වෙරළ ආශ්‍රිතව ජීවත්වන ජනතාවට යහපත් දිවි පෙවතක් ගත කිරීමට සහ ඔවුන්ට අවශ්‍යවන සංවර්ධන ක්‍රියාදාමයන් ආරක්‍ෂා කිරීමට මූලිකත්වය දීම සහතික කිරීම.

4 ඉන්දියන් සාගර කලාපයේ වූ ලක්ෂණ අතර ජීවී විශේෂ සහ පරිසරය අතරවූ සංකීර්ණ සම්බන්ධතා ඇතිකරන්නාවූ ඉහළ කරදිය ජෛව විවිධත්වයන්ද සංවේදී ඉහළ පලදායීතාවයකින්ද යුත් පරිසර පද්ධතීන් වේ. කෙසේ වුවද මෙම පරිසරයේ වූ සියළුම රටවල් වාගේ වෙරළාසන්න ධීවර සම්පත්හි දුර්වල කලමනාකරණයක්ද, අධිභාවිතයක්ද දක්නට ඇත. මෙම සම්පත් ධීවර පවුල්වල ප්‍රධානම ජීවනෝපාය වුවද ධරණීය නොවන පතුල ට්‍රෝලිංකරණය වැනි විනාශකාරී ධීවර තාක්ෂණය භාවිතා කරන දේශීය සහ විදේශීය ධීවර යාත්‍රා විසින් මෙම සම්පත් දැඩි ලෙස භාවිතා කිරීමේ යෙදේ. මෙවැනි තිරසාර නොවන ක්‍රියාකාරකම් භාවිතයේදී සුළුපරිමාණ ධීවර ආම්පන්නවලට අලාභහානි සිදුවන අතර, එකිනෙක ගැටීම තුලින් ජීවිත හානිද සිදුවේ. අක්වෙරළ ප්‍රදේශයන්හි භාවිතයට නොගත් සම්පත් ඇතිබව දන්නාවුවද ඒ සඳහා කලමණාකරණ සංවිධානයන් නොමැත. එසේ නැතිනම් ඒවා දුර්වලය. ඉන්දියන් සාගරයේ වැදගත් තෙල් හා ඛණිජ සම්පත්ද දැනට භාවිතයට ගනිමින් පවතී. ප්‍රවාහන මාධ්‍යයක් ලෙස භාවිතා කරනවා මෙන්ම නාගරික, කාර්මික හා විෂසහගත අපද්‍රව්‍ය අවශෝෂණය කිරීමේ මාධ්‍යයක් ලෙසද ඉන්දියන් සාගරය ක්‍රියාකරයි.

සුළුපන්න ධීවර ජනතාවගේ ජීවන තත්වය ආරක්ෂා කිරීමට සහ මුහුදු සහ එහි සම්පත්වල පදායීතාවය පවත්වාගෙන යාමට අවශ්‍ය නම්,

✶ කලාපීය රාජ්‍යයන් විසින් ධීවර සම්පත් කළමණාකරණය හා සම්පත් භාවිතය සඳහා සමාජ සාධාරණත්වයෙන් යුත් පරිසර පද්ධති මත පදනම් වූ ක්‍රමයන් යොදාගත යුතුය.

✶ රජය විසින් පතුල් ට්‍රෝලින්කරණය වැනි විනාශකාරී ධීවර ආම්පන්න හඳුනාගෙන ධීවර ධාරිතාවය කළමණාකරණය පිලිබඳව අන්තර් ජාතික ක්‍රියාකාරී සැලසුමට අනුව යාත්‍රා අධිධාරිතාවය තක්සේරුකර එය එය අඩු කිරීම සඳහා ක්‍රියාකල යුතුය. සමාජ ආර්ථික හා පාරිසරික කරුණු සලකා බලා සුළුපන්න ධීවර කර්මාන්තයේ යෙදීමේ ප්‍රමාණයට අනුව ප්‍රමුඛව සලකා කාර්මික යාත්‍රා යෙදවීම අවම කල යුතුය.

✶ ධීවර ජනතාව තුළ සුළු පරිමාණ වරණීය හා තිරසාර මසුන් නෙළීමේ තාක්ෂණ ක්‍රම දිරි ගැන්වීම කල යුතු අතර, එය ධීවර ප්‍රජාවගේ අස්වනු නෙළීමේ පූර්ව හා පශ්චාත් ක්‍රියාකාරී සබඳතා වර්ධනය කෙරෙන සහ රැකියා අවස්ථාවන් පවත්වා ගැනීමට හේතුවිය යුතුය.

✶ රාජ්‍යයන් විසින් සාගරය දූෂණය වන ක්‍රියාකාරකම් වැළැක්වීමට පියවර ගත යුතුය. ඒවා ගොඩබිම ආශ්‍රිත කටයුතු වලින් මුහුදු පරිසරය සංරක්ෂණය කිරීම සඳහා සම්මත කර ඇති ජගත් ක්‍රියාකාරී සැලසුමට හා වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් හා එකගතාවලට අනුව සිදුකල යුතුය. මුහුදේ ප්‍රවාහණ කටයුතු යටිතල පහසුකම් සංවර්ධනය, ජීවී නොවන ද්‍රව්‍ය නිස්සාරණය විෂ අපද්‍රව්‍ය හා වෙනත් අපද්‍රව්‍ය හෙළීමද මෙයට අයත්ය.

5 මුහුද ආශ්‍රිත ධීවර ප්‍රජාවන්හි කාන්තාවන්ට ආර්ථික ක්‍රියාකාරකම්වලදී පැවරෙන කාර්යය අනිකුත් ප්‍රදේශයන්ට හා සංස්කෘතීන්ට වෙනස් වුවත්, ජීවිකාව තිරසාර බවට පත් කිරීමේදී ඇයට පැවරෙන කර්යය ලෝක ධීවර ප්‍රජාවම ගත්කල එක සමානය. මුහුදුබඩ පාරිසරික පද්ධතීන් විනාශය සහ ධීවර ජනතාව අවතැන් ගතවීම ධීවර කාන්තාවගේ ජීවන තත්වයයේ ගුණාත්මකත්වයට සහ කාර්යය බහුලත්වයට අහිතකර ලෙස බලපා ඇත. කාන්තාවගෙන් කෙරෙන කාර්යයන් ධීවර ප්‍රජාව තුල පිලිගැනීමක් නොමැතිවීම සහ ඇයගෙන් ඉටුවන කාර්යය පිලිබඳව නිශ්චිතව තොරතුරු නොමැතිවීම හෝ ඉතා සුළු ප්‍රමාණයක් පමණක් පිළිඹිඹුවීම නිසා ඒ පිලිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් කලයුතු ප්‍රධාන දෑ අතර

✶ වෙරළාසන්න ප්‍රජාවන්හි ධීවර කාන්තාව යෙදෙන කාර්යයන්හි වටිනාකම හඳුනාගෙන ඔවුන්ගේ කාර්යය පිලිබඳ තොරතුරු ගොනුවක් වර්ධනය කිරීම.

✶ ධීවර කාන්තාවට දැනට හිමිව ඇති තත්වය ආරක්ෂා කිරීම සහතික කිරීම.

✶ සම්පත් කලමනාකරණ ක්‍රියාවලියේදී සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තාවගේ සහභාගීත්වය සහතික කිරීම.

✶ සංවිධානාත්මක සහ සංවිධානය නොවූ අවිධිමත් අංශ දෙකෙහිම කාන්තාවගේ කාර්යයක් වන මසුන් සැකසීමේ ක්‍රියාවලියේ නියුතු කාන්තාවන්ගේ රැකියාවේ තත්වය දියුණු කිරීමට ක්‍රියා කිරීම.

6 සුළුපරිමාණ ධීවර යාත්‍රා මුහුදුසීමා උල්ලංඝණය කරමින් සිරි කරන ධීවර කටයුතු හේතුවෙන් රජයන්ගෙන් දඬුවම් ලබන, සිරගතවීම්වලට භාජනය වන ධීවරයින් තම ප්‍රජාවටත් මෙම ප්‍රශ්ණවලදී මැදිහත් කරුවන් වන බලධාරීන්ටත් ප්‍රශ්ණයක් වී ඇත. 1982 සාගර නීතිය සම්බන්ධව පැවැත්වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේදී අනන්‍ය ආර්ථික කලාපයක් (EEZ) සඳහා පැනවූ මුහුදු සීමාවන් නිසා මෙම ප්‍රශ්ණය විශාල වශයෙන් ඇතිවූවායැයි කිව හැක. උදාහරණයක් වශයෙන් 1982 සම්මුතියේදී වෙරළාසන්න ධීවර ජනතාවට හිමිව තිබූ සම්ප්‍රදායික මත්ස්‍ය බිම් ඔවුන්ට අහිමිවන ආකාරයට කටයුතු කර ඇත. කෙසේ හෝ කෙසේ වුවද මෙම සුළු පරිමාණ ධීවර ඒකකයන්හි ධාරිතා වර්ධනයේද එමෙන්ම වෙරළාසන්න දේශීය ධීවර සම්පත් හීනවීමේද ප්‍රථිපල ඇති කල පීඩනය නිසා සිදු වන්නක්ද වේ. ධීවර ජනතාවගේ මානව හිමිකම් සුරැකීම සඳහා මෙම සංකීර්ණ ප්‍රශ්ණයට ස්ථිරසාර විසඳුම් ලබා ගැනීමට අවශ්‍යව ඇත. එසේ හෙයින් වැදගත් වනුයේ.

- 1982 සම්මුතියේ 73 වගන්තියේ පෙන්වාදී ඇති ආකාරයට අනිකුත් රටවල මුහුදු තීරයට ගොස් සිටින ධීවරයින් අල්ලා සිරගත කිරීම සඳහා සකසා ඇති නීතියට අනුකූලව ක්‍රියාමාර්ගයන්ට එළඹීමට කටයුතු කල යුතුය. එසේත් නැතිනම් 1976 ශිෂ්ඩාචාරය හා දේශපාලනීය අයිතීන් සම්බන්ධ ජාත්‍යන්තර ගිවිසුම් වගන්තීන්ට ගැලපෙන ආකාරයට සහ 1976 ආර්ථික සමාජීය සහ සංස්කෘතික අයිතීන් සම්බන්ධ ජාත්‍යන්තර ගිවිසුමට අනුව නීති සැකසීම කලයුතුය. නීති විරෝධී මසුන් ඇල්ලීම සඳහා දඬුවම් ප්‍රමාණය වරදට ගැලපෙන ආකාර ප්‍රතිපත්තියක් මත රදා පැවතිය යුතුය.

- අල්ලාගත් ධීවරයින්ට නිදහස්වී නැවත තම රටට කඩිනමින් පැමිණීමට හැකිවන ආකාරයේ යාන්ත්‍රණයක් සැකසීමට මූලිකත්වය දීමට රාජ්‍යයන් විසින් ක්‍රියා කල යුතුය.

- ධීවර ජන ජීවිතයට සම්බන්ධ ඓතිහාසික මුහුදු සීමාවන්හි දැඩිලෙස ක්‍රියාවේ යෙදවීම එවැනි ප්‍රදේශවල සිටින ධීවර ප්‍රජාවගේ ජීවිත හා ධීවර කර්මාන්තය දරුණු අපහසුතාවයන්ට ලක්වීමට හේතුවිය හැකිබැවින් ඔවුන්ගේ අවශ්‍යතාත්, වෙනත් රටවල ජාතික ආරක්‍ෂාවත් සැලකිල්ලට ගනිමින් ක්‍රියාකල යුතුය.

- දේශීය ජලතීරයේ නීති විරෝධී ධීවර කටයුතුවල යෙදෙන සුළු පරිමාණ ධීවර ඒකක භාවිතා කරන ධීවරයින් අත්අඩංගුවට පත්වීමෙන් පසුව, නීති විරෝධී සංක්‍රමිණකයන්ට අදාළ නීතිය යටතේ ඔවුන්ට දඬුවම් නොකළ යුතුය. එවැනි අවස්ථාවලදී ධීවර මෙහෙයුමේ යෙදුනේ දේශීය ජලතීරයේ නොවන අනන්‍ය ආර්ථික කලාප සීමාවේදී නම් දඬුවම් දීම නොකල යුතුය. දේශීය ජලතීරය තුල සිදු කරන නීති විරෝධී කටයුතු වලට දඬුවම තරමක් දැඩි වි හැකි නමුත් අනන්‍ය ආර්ථික කලාපයේ දී මෙවැනි අවස්ථාවලදී ලබාදෙන දඬුවම් අනන්‍ය ආර්ථික කලාපය උල්ලංඝණය කල ධීවරයින්ට ලබාදෙන අඩුවම්වලට වඩා දැඩි නොවිය යුතුය. එවැනි දඬුවම් දීම යෝග්‍ය නැත.

- රාජ්‍යයන් අතර පැවැත්වෙන මුහුදු සීමා අරගලයන්ට ධීවරයින් හවුල්කාරයින් කර නොගත යුතුය. ඔවුන්ගේ ජීවිකාව ගෙනයාමට අවශ්‍ය මත්ස්‍ය සම්පත් ඇති ස්ථානවලට ලගාවීමට අවශ්‍ය සෑම පහසුකමක්ම රජය විසින් සපයා දිය යුතුය.

7 සංවර්ධනය වන රටවල් දිගුකාලීන දැරීමේ හැකියාව සහිත සාපේක්‍ෂව කුඩා යාත්‍රා නිපදවීමෙන් සහ ධරණීය ධීවර ක්‍රම භාවිතා කිරීම මගින්, මුහුදුසීමාවට දේශසීමා මායිම් නොමැති රටවල් මහා පරිමාණ ධීවර යාත්‍රා මගින් ඉහළ සංක්‍රමණික හැකියාවක් ඇති මත්ස්‍ය සම්පත් අනවශ්‍ය බව පෙන්වා දී ඇත. මෙම මුහුදට තම දේශසීමා සහිත, සංවර්ධනය වන රටවලින් බිහිවන මෙම කුඩා පරිමාණ අංශයේ ක්‍රියාකාරිත්වය දිරිගැන්වීම් වස්;

- තමන්ට අතිරික්ත සම්පත සහිත සුළු පරිමාණ හා මුහුදට ඔරොත්තු දෙන එවැනි ධීවර යාත්‍රා වලට තම මුහුද භාවිතය සඳහා වෙරළාසන්න රටවලින් ඉඩකඩ සලසාදීම සලකා බැලීම කල යුතුය. මෙවැනි ධීවර යාත්‍රාවන්හි පාලනය හා වගකීම අදාළ ධීවර ධජය දරණ රජයට පැවරේ.

- අතිරික්ත මත්ස්‍ය සම්පත් සහිත රටවල ධීවර කටයුතු කිරීමට සිය කුඩා පරිමාණ දිගු දුර යාත්‍රාවන්ට ඉඩ ප්‍රස්තා සලසමින් එවැනි ධීවර කටයුතු නිත්‍යානුකූලව සහ වගකීමෙන් යුතුව කටයුතු කිරීම තහවුරු කිරීමට ධීවර ඒකක සමග එවැනි රටවල් ගිවිසුමකට එලඹිය යුතුය.

- තමන්ගේ අතිරික්ත ධාරිතාව හා විනාශකාරී පන්න ක්‍රම අපනයනය නොකිරීමට රාජ්‍යයන් කටයුතු කල යුතුය.

* ධීවර යාත්‍රා දේශසීමා මුහුදුසීමා උල්ලංඝණය කිරීමට යම්තරමකටවත් දායක වනුයේ අනන්‍ය ආර්ථික කලාප වල දුර්වල ගලනය බව තේරුම්ගෙන වෙරළාසන්න රාජ්‍යයන් තම ධීවර සම්පත් කලමනාකරණය වර්ධනය කරගත යුතු අතර, සිය ධීවර ඒකකවල මහා ගලනයක් සිදු කරමින් වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් දෙසට යොමුවිය යුතුය.

* ආහාර සුරක්‍ෂිතභාවය ආර්ථික ශුභසාධනය සහ සංවර්ධනය සඳහා ධීවර සම්පත්මත තදින්ම යැපෙන සංවර්ධනය වන්නාවූ කුඩාදූපත් රාජ්‍යයන්ට මෙය විශේෂයෙන් අදාල වේ.

8 ඉන්දිය සාගර කලාපයේ පවතින වටිනාකමින් වැඩි ඉහළ සංක්‍රමණික හැකියාවක් සහිත මත්ස්‍ය විශේෂයන්හි ප්‍රධාන ප්‍රතිලාභීන් මෙම කලාපයේම දේශසීමා සහිත වෙරළාසන්න රාජ්‍යයන් නොවේ. දිගුදුර ධීවර කර්මාන්තයේ නියුතු රටවල ධීවර යාත්‍රා වලින් කෙලවල්ලන් පවුලේ මසුන් ඇල්ලීමේ ඉතා ඉහළ වර්ධනයක් මෑතකදී පෙන්නුම් කලද 1982 ගිවිසුමට අනුව එය භාවිතය තුලින් අයිතිය ලැබීමක් ලෙස අර්ථකථනය නොකල යුතුය. මේ වෙනුවට මෙම සම්පත් සඳහා වූ ප්‍රවේශය පිළිබඳව ගන්නා තීරණවල පදනම විය යුත්තේ;

  * සම්පත් නෙලීම පිලිබඳව සැබෑ සම්ප්‍රදායක් තිබීම.
  * මෙම සම්පත් මත රටේ ආර්ථිකය රඳා පැවතීම.
  * කලාපයේ ඇති සංවර්ධනය වන කුඩා දූපත් රාජ්‍යයන් හා වෙනත් සංවර්ධනය වන රාජ්‍යයන්හි ආර්ථික හා සමාජීය සංවර්ධන විභවයවේ.

9 වෙරළාසන්න ධීවර ප්‍රජාවට හෝ රටේ දිගුකාලීන ආර්ථික අවශ්‍යතාවයන්ට හෝ වාසිදායක තත්වයක් නොමැතිව වුවද, දිගුදුර ධීවර කර්මාන්තයේ නියුතු ජාතීන් සමග කලාපයේ වෙරළාසන්න රාජ්‍යයන් ගිවිසුම් වලට එලඹ ඇති බවට සාක්‍ෂි ඇත. ඔවුන්ගේ මෙම වෙළදාම හා ආධාර මත පදනම්ව, ධීවර කර්මාන්තයේ නිරතවීමට කරනු ලබන අසාධාරණ පීඩනය මත ජාත්‍යන්තර එකගතාවයන්ට පටහැනිව මෙවැනි ගිවිසුම් ඇතිකර ගත හැකි අතර සාධාරණ ගිවිසුම් ඇතිකර ගැනීමට නම්,

* ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා සම්පත් සඳහාවූ ප්‍රවේශය වෙළදපොළ මත පදනම් කිරීම හෙලාදකින ආචාර ධර්ම පද්ධතියන්හි වගන්ති 11.2.7 සහ 11.2.8 යන වගන්තීන් ක්‍රියාත්මක කලයුතුය.

* දිගු දුර ධීවර සම්පත් නෙලන රාජ්‍යයන් සම්පත ප්‍රවේශය ලබාදෙන ගිවිසුම්වලට එළඹීමට ප්‍රථම වෙරළාසන්න ධීවර ප්‍රජාවගේ අයිතීන් හා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ජාතික ධීවර ප්‍රතිපත්තීන් සැකසීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

* දිගුදුර රාජ්‍යයන්හි ධීවර සමාගම් සමග ඒකාබද්ධව ධීවර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී සහ එකගතා ගිවිසුම් සැකසීමේදී දූෂණය පිටු දැකීම සඳහා පූර්ණ පාරදෘශ්‍යභාවය සහ වගකීම සහතික කිරීමට රාජ්‍යයන් ක්‍රියා කල යුතුය.

* දිගුදුර ධීවර යාත්‍රාවන්හි සේවාවන්හි නිරතවන ධීවර කාර්මිකයන්ගේ සේවාවන් හා වැඩකටයුතු පිලිබඳව කොන්දේසි සියල්ල එක්සත් ජාතීන්ගේ කම්කරු සංවිධානයේ සහ අන් සියළු පිළිගත් ජාත්‍යන්තර නීතියට හා රීතීන්ට යටත්ව සිදුවිය යුතුය.

10 ඉහළ මට්ටමේ අන්‍යෝන්‍ය ගැටීම් තුලින් සහ සිය තොරතුරු අත්දැකීම් කුසලතා නිපුණතා සහ සංවර්ධන විකල්පයන් හුවමාරු කර ගැනීම තුලින් ඉන්දියන් සාගර කලාපයේ වෙරළාශ්‍රිත ප්‍රජාවන්ට මහත් ප්‍රතිලාභ අත්පත් කරගත හැකිය.

ඉන්දිය සාගරයේ බටහිර ප්‍රදේශයේ රටවල ජාතීන්ටද, ආසියානු රටවල ධීවර හා කාර්මීකරණයේ සංවර්ධන උපාය මාර්ගය තුලින් ලබා ඇති අහිතකර අත්දැකීම් අධ්‍යනය කිරීමෙන් දැනුම වර්ධනය කලහැකිය. මුල්කාලවලදී එමගින් වෙරළාසන්න ධීවර සම්පත් හා වෙරළාසන්න පරිසර පද්ධතීන් වෙත අහිතකර බලපෑමක් සිදු කර ඇත. උදාහරණ ලෙස කාර්මික ඉස්සන් වගාව, වෙරළාසන්න පරිසර පද්ධතීන්ට හා වෙරළාසන්න ප්‍රජාවගේ ජීවන මාර්ගයන්ට ඇතිකල අහිතකර බලපෑම් සඳහන් කල හැකිය.

11 ඉහත සදහන් කල දෑ සිහිතබා ගනිමින්ද ප්‍රජාව මත පදනම් වූ එමෙන්ම තිරසාර වූ සංවර්ධන විකල්ප පිලිබදව ඇති සුභවාදී උදාහරණ සැලකිල්ලට ගනිමින්ද දකුණු දකුණු සහයෝගිතාවය ශක්තිමත් කල යුතුය මෙය විශේෂයෙන්ම අදාල වනුයේ මානව සම්පත් කුසලතා වර්ධනය යෝග්‍ය සහ පාරිසරික වර්ධනයෙන් යුත් තාක්‍ෂණය භාවිතය සම්පත් සංරක්‍ෂණය සහ පුනර්ජීවන ක්‍රියාකාරකම් කෙරෙහිය.

12 “එක්සත් ජාතීන්ගේ ශිෂ්ඨාචාරයන් අතර සංවාදය පිලිබද වර්ෂයේදී” සහ ලෝක සාමය පිලිබද වත්මන් අභියෝගතා මධ්‍යයේ අපි සැම, විශේෂයෙන්ම ඉන්දියන් සාගරයේ හා එහි වෙරළාසන්න ප්‍රජාවගේ අනාගතය පිලිබදව වගකීම හා උද්යෝගය සහිතව හා ඉන්දියන් සාගරයේ අනාගතය සදහා ජාතීන් අතර සහයෝගීතාවය හා එකමුතුව වර්ධනය කිරීමට මෙම දර්ශන ප්‍රකාශණය මෙසේ සම්මත කර ගතිමු.

චෙන්නායි, ඉන්දියාව - 2001 ඔක්තෝබර් 13